**මාධ්‍ය නිවේදනය**

**ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2020 වර්ෂයේ තෙවන කාර්තුව**


**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**මුදල් අමාත්‍යාංශය**

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk


…………………………………………………………………………………………………….

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 තෙවන කාර්තුව (ජූලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා) සඳහා දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක නිෂ්පාදන ප්‍රවේශය අනුව පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කර නිකුත් කොට/ ප්‍රකාශයට පත්කොට ඇත.

2020 වර්ෂයේ තුන්වන කාර්තුව තුළදී, කොවිඩ්-19 වසංගතයේ පළමු රැල්ලෙන් පසුව ව්‍යාපාරික ක්‍රියාකාරකම් නව සාමාන්‍යකරණය වීමත් සමඟම ජනතාවගේ එදිනෙදා ජීවන රටාව යථා තත්ත්වයට පත්විය. මෙම වාසිදායක තත්ත්වය විශේෂයෙන් තුන්වන කාර්තුවේදී ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපා ඇති අතර මෙම තත්ත්වය 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රථම වතාවට සියයට 1.5 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කිරීමට හේතු වී තිබේ. මෙම වසරේ පළමු හා දෙවන කාර්තු වල ආර්ථිකයේ හැකිලීමෙන් පසු මෙම වාර්තාගත ධනාත්මක වර්ධන වේගය පිළිබිඹු කරනු ලබන අතර, ඒ අනුව සමස්ථයක් ලෙස කෘෂිකර්මාන්තය, නිෂ්පාදන කර්මාන්ත, තොග හා සිල්ලර වෙළඳාම, භාණ්ඩ හා මගී ප්‍රවාහනය, තොරතුරු තාක්ෂණය, විදුලි සංදේශසේවය, මූල්‍ය හා රක්ෂණ සේවා, දේපළ වෙළඳාම්, වෘත්තීය සේවා සහ පෞද්ගලික සෞඛ්‍ය සේවා ඇතුළු බොහෝ සේවා ක්‍රියාකාරකම් 2019 වසරේ තුන්වන කාර්තුව සමඟ සසඳන විට 2020 තෙවන කාර්තුවේ ධනාත්මක වර්ධන අනුපාත වාර්තා කර ඇත.

2020 තෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කිරීම පිළිබඳ ප්‍රකාශයක් නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ 2020 තෙවන කාර්තුව සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට 1.5 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති බවයි. 2020 තුන්වන කාර්තුව සඳහා ස්ථාවර මිල අනුව ශ්‍රී ලංකාව සඳහා දළ දේශීය නිෂ්පාදිතය රු. මිලියන 2,545,863 ක් වූ අතර එය 2019 තුන්වන කාර්තුවේදී රු. මිලියන 2,509,418 ක් ලෙස වාර්තා විය. මීට අමතරව, 2020 තුන්වන කාර්තුවේ දී ශ්‍රී ලංකාව සඳහා දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිලට අනුව රු. මිලියන 4,085,213 වන අතර එය 2019 තුන්වන කාර්තුවේදී රු. මිලියන 3,833,960 ක් ලෙස වාර්තා වී ඇති අතර එය පවත්නා මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 6.6 ක වෙනස් වීමක් පෙන්නුම් කරයි.

2020 තෙවන කාර්තුවේදී ආර්ථිකයේ ප්‍රධාන අංශ වන 'කෘෂිකර්මාන්ත', 'කර්මාන්ත', 'සේවා' සහ 'භාණ්ඩ මත ලබාදුන් සහනාධාර අඩු කරන ලද බදු ' පිළිවෙලින් සියයට 8.2, සියයට 27.7, සියයට 56.8 සහ සියයට 7.4 කින් දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි දායක වී ඇත. තුන්වන කාර්තුවේදී කෝවිඩ් - 19 වසංගතයේ පළමු රැල්ල අවසන් වීමත් සමඟ, එම සමස්ත වාසිදායක තත්ත්වය බොහෝ ආර්ථික

ක්‍රියාකාරකම් ධනාත්මකව සිදු කිරීමට සහාය වූ අතර එය රටේ ආර්ථික ක්‍රියාකාරිත්වය යම් තාක් දුරකට වේගවත් කිරීමට හේතු විය. ඒ අනුව, 2020 වර්ෂයේ පළමු වතාවට කෘෂිකර්මාන්තය, කර්මාන්ත හා සේවා යන ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වයම 2020 තුන්වන කාර්තුවේදී ධනාත්මක වර්ධන අනුපාතයන් වාර්තා කර ඇත. කෘෂිකාර්මික අංශය, 2020 තෙවන කාර්තුවේදී සියයට 4.3 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර කාර්මික අංශය ද මෙම කාර්තුව තුළ සියයට 0.6 ක වර්ධනයක් වාර්තා කර තිබේ. ඒ අතරින් නිෂ්පාදන කර්මාන්තය ද 2019 තුන්වන කාර්තුව හා සසඳන විට මෙම කාර්තුවේදී සියයට 5.3ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. එමෙන්ම, සේවා අංශය ද මෙම කාර්තුව තුළ සියයට 2.1 ක ධනාත්මක වර්ධන අනුපාතයක් වාර්තා කර තිබේ.

**කෘෂිකර්මාන්ත අංශය**

පසුගිය වසරේ තෙවන කාර්තුව හා සසඳන විට 2020 තෙවන කාර්තුවේදී කෘෂිකාර්මික කටයුතුවල වර්ධනයට 'ධාන්‍ය වගා කිරීම ' (සියයට 256.6), 'මිරිදිය මසුන් ඇල්ලීම' (සියයට 20.6), 'සහල් වගා කිරීම' (සියයට 15.5), 'එළවළු වගා කිරීම' (සියයට 11.6) , 'රබර් වගා කිරීම ' (සියයට 11.5), 'පලතුරු වගා කිරීම ' (සියයට 8.3), 'කුළුබඩු වගා කිරීම ' (සියයට 6.0) සහ 'සත්ත්ව නිෂ්පාදනය' (සියයට 2.8) යන ආර්ථික කටයුතුවල සිදුවූ වර්ධනයන් ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුවද, 'සමුද්‍රීය මසුන් ඇල්ලීම' (සියයට 11.6), 'වන වගාව සහ දැව කැපීම' (සියයට 7.8), 'තෙල් සහිත පලතුරු වගා කිරීම; පොල් ඇතුළුව (සියයට 5.1) සහ 'තේ වගා කිරීම' (සියයට 4.3) යන ආර්ථික කටයුතු 2020 තුන්වන කාර්තුවේදී තවදුරටත් පසුබෑස්මක් වාර්තා වී ඇත.

**කර්මාන්ත අංශය**

2020 තෙවන කාර්තුවේදී, සමස්ත කාර්මික ක්‍රියාකාරකම් සියයට 0.6 ක ධන වර්ධන වේගයක් වාර්තා කර තිබේ. ව්‍යාපාරික කටයුතු සාමාන්‍යකරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස තෙවන කාර්තුවේදී නිෂ්පාදන කර්මාන්තයේ වාර්තා වූ සියයට 5.3 ක සැලකිය යුතු වර්ධනය මෙම ධනාත්මක වර්ධනයට මූලික වශයෙන් හේතු වේ. රට විවෘත කිරීමෙන් පසුව, නිෂ්පාදන අංශයේ බොහෝ ක්‍රියාකාරකම් නිෂ්පාදන ක්‍රියාවලියේදී නැවතත් ඔවුන්ගේ සුපුරුදු හැකියාවන් කරා ආපසු යොමු වීමට පටන් ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදන අංශයේ බොහෝ ක්‍රියාකාරකම් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කාර්මික අංශයට වැඩිම දායකත්වයක් සපයන 'ආහාර, පාන සහ දුම්කොළ නිෂ්පාදන' ක්‍රියාකාරකම් (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.9 ක දායකත්වයක් සපයන) 2020 තෙවන කාර්තුවේදී සියයට 11.5 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇත. මීට අමතරව, 'රසායනික නිෂ්පාදන හා මූලික ඖෂධ නිෂ්පාදනය' (සියයට 13.1), 'රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනය' (සියයට 4.8), 'වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය' (සියයට 4.2), 'වෙනත් නිෂ්පාදන' (සියයට 1.1) සහ 'රෙදිපිළි නිෂ්පාදනය, ඇඟලුම් හා සම් ආශ්‍රිත නිෂ්පාදනය' (සියයට 0.1) වශයෙන් තෙවන කාර්තුවේදී ධන වර්ධන වේගයන් වාර්තා කර තිබේ. කෙසේ වෙතත්, 'මූලික ලෝහ හා පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදනය' (සියයට 6.9) සහ 'යන්ත්‍රෝපකරණ හා උපකරණ නිෂ්පාදනය' (සියයට 0.7) යන ක්‍රියාකාරකම් පසුබෑසීම් වාර්තා කර ඇත.

කර්මාන්ත අංශයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.5 ක දායකත්වයක් සපයන 'ඉදිකිරීම් කර්මාන්තය' මෙම කාර්තුවේදී සියයට 9.1 ක පසුබෑස්මක් වාර්තා කර ඇති අතර එමගින් එම කර්මාන්තය කෙරෙහි කෝවිඩ් - 19 වසංගතයේ අඛණ්ඩ බලපෑම තව දුරටත් පෙන්නුම් කරයි. ඉදිකිරීම් කටයුතුවල පහත වැටීමෙන් පසුව, 2020 තුන්වන කාර්තුවේදී 'පතල් හා කැණීම්' ක්‍රියාකාරකම් ද සියයට 6.8% ක පසුබෑස්මක් වාර්තා කර ඇත. මේ අතර 'විදුලිය, ගෑස්, හා

වාසැපයුම්'කර්මාන්තය සහ 'ජලය එකතු කිරීම,පිරිසිදු කිරීම හා බෙදා හැරීම' මෙම කාර්තුවේදී පිළිවෙලින් සියයට 2.1 ක් සහ සියයට 4.1 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

**සේවා අංශය**

2020 තුන්වන කාර්තුව තුළ සේවා අංශය සැලකිය යුතු ලෙස සියයට 2.1 කින් වර්ධනය විය. 'විදුලි සංදේශ' (සියයට 16.5), 'තොරතුරු තාක්ෂණ වැඩසටහන් උපදේශනය සහ ආශ්‍රිත ක්‍රියාකාරකම්' (සියයට 13.5), 'මූල්‍ය සේවා ක්‍රියාකාරකම්' (සියයට 12.3), 'මානව සෞඛ්‍ය ක්‍රියාකාරකම්' (සියයට 4.6) 'රක්ෂණ කටයුතු' (සියයට 4.1), 'තොග හා සිල්ලර වෙළඳාම' (සියයට 2.9) සහ 'ප්‍රවාහන සේවා' (සියයට 0.9) ලෙස ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කොවිඩ් - 19 වසංගතයේ අහිතකර බලපෑම හේතුවෙන්, 'නවාතැන්, ආහාරපාන හා සේවා ක්‍රියාකාරකම්වල සියයට 42.1 ක කැපී පෙනෙන හැකිලීමක් වාර්තා විය. 'වෙනත් පුද්ගලික සේවා' ද මෙම කාර්තුවේදී සියයට 0.5 ක පසුබැස්මක් වාර්තා කර ඇත.

2020 තෙවන කාර්තුවට අදාල ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳව විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk/NationalAccounts /StaticalInformation/GDP වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇති බව දෙපාර්තමේන්තුව පවසයි.



පී. එම්. පී. අනුර කුමාර
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)